

## තත්ත්ව වාර්තාව

# වත්කම් බැරකම් නීතිය බලාත්මක කිරීම

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

තත්ත්ව වාර්තාව

# වත්කම් බැරකම් නීතිය බලාත්මක කිරීම

## හැඳින්වීම

දූෂණයට එරෙහිව ක්‍රියාත්මක කළ හැකි ශ්‍රී ලංකාවේ පවත්නා බලවත්ම නීතියක් ලෙස සැළකෙන වත්කම් බැරකම් නීතිය[1] 1975 වසරේ සිට ක්‍රියාත්මක වන්නකි. පසුව ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතා 1998 වර්ෂයේදී එම පනත සංශෝධනයට[2] ලක් කරමින් එය වඩාත් විධිමත් හා බලාත්මක නීතියක් බවට පත් කළේය.

යම් නිශ්චිත කාල සීමාවක් තුළදී තම වත්කම් හා බැරකම් ප්‍රකාශ කරන ලෙස නිශ්චිත තනතුරුවලට අයත් නිලධාරීන්ට බල කිරීමේත්, මෙම නීතිය අදාළ වන පුද්ගලයන්ට එරෙහිව ලැබෙන ලිඛිත නිවේදන මත විමර්ශන කටයුතු කිරීමේත්, වත්කම් හා බැරකම් ප්‍රකාශ නොකිරීම හා අසත්‍ය ප්‍රකාශ කිරීම පිළිබඳව දඬුවම් කිරීමේත් පරමාර්ථයෙන් මෙම නීතිය පනවන ලදී. එසේම මෙම නීතිය මගින් රාජ්‍ය නිලධාරීන් හා මහජන නියෝජිතයින්ගේ වත්කම් බැරකම් පිළිබඳ පාරදෘශ්‍යභාවයක් ඇති කරනු ලැබූ අතර එමගින් රජයේ සේවකයින් හා නියෝජිතයින්ට අල්ලස්-දූෂණවල යෙදීමට හා අයථා පරිදි ධනය රැස්කිරීමට ඇති ඉඩ ප්‍රස්ථා අවහිර කර තිබේ.

කවර වර්ගයන්ට හෝ පන්තීන්ට අයිති පුද්ගලයින් විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම කළ යුතු ද යන්න පනතේ දෙවන වගන්තියේ සඳහන් වන අතර ඔවුන් විසින් වත්කම් ප්‍රකාශ කළ යුත්තේ කවුරුන්හටද යන්න පනතේ හතරවන වගන්තිය මගින් නියම කොට ඇත. එම පනතට අනුව සියලුම පාර්ලිමේන්තු හා පළාත්සභා මන්ත්‍රීවරුන්[3] විනිසුරුවරුන් සහ ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන නිලධාරීන්, කැබිනට් ඇමතිවරුන් විසින් පත් කරන නිලධාරීන්, රාජ්‍ය ආයතන සභාපතිවරුන්, අධ්‍යක්‍ෂකවරුන් හා මාණ්ඩලික නිලධාරීන් සහ සංස්ථා හා සංස්ථාපිත මණ්ඩල නිලධාරීන් තම වත්කම් බැරකම් ප්‍රකාශන භාරදීමට කටයුතු කළ යුතුය.

පළාත්පාලන ආයතනවල මහජන ඡන්දයෙන් තේරී පත්වන සභිකයින් සහ එහි නිලධාරීන් මෙන්ම ලියාපදිංචි දේශපාලන පක්‍ෂවල නිලධාරී මණ්ඩල සාමාජිකයින්ද තම වත්කම් බැරකම් ප්‍රකාශ කළ යුතු වන පරිදි එම පනත 1988 දී වඩාත් පුළුල්ව සංශෝධනයට ලක් කරන ලදී. මෙම පනතේ තවත් විශේෂත්වයක් වනුයේ එහි සඳහන් රෙගුලාසි බොහොමයක් ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු හා පළාත්සභා මැතිවරණ පිළිබඳ පනත් කෙටුම්පත් මගින්ද ආවරණය වීමය.

1. වත්කම් බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ පනත 1975
2. 1988 වත්කම් බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ සංශෝධිත පනත අංක 74
3. දෙවන වගන්තිය වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ සංශෝධිත පනත 1988

## ජනාධිපති අපේක්ෂකයන්ද වත්කම් ප්‍රකාශ කළ යුතුය

වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේදී කරුණු සැඟවීම, විකෘති කිරීම වැනි අවස්ථාවන්හිදී එලෙස ක්‍රියාකරන පුද්ගලයින්ට දඩුවම් කිරීමට හැකිවන පරිදි නියමයන් ඊට ඇතුළත්ය. ජනාධිපති තනතුරේ වැඩ භාර ගැනීමෙන් පසු ජනාධිපති විසින් වත්කම් බැරකම් ප්‍රකාශ කළ යුතු බවට විධිවිධානයක් 1975 වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ සඳහන්ව නොමැත. මෙම පනත පනවන ලද වකවානුවේදී රටේ විධායක ජනාධිපතිවරයෙක් නොවීය. එහෙත් මෙම පනතට 1988 දී ගෙන එන ලද සංශෝධනය මගින් ජනාධිපතිවරණයට ඉදිරිපත් වන සියලු අපේක්ෂකයින් නාමයෝජනා දිනයේදී හෝ ජනාධිපති ධූරයේ කටයුතු ආරම්භ කිරීමට පෙර තම වත්කම් හා බැරකම් ප්‍රකාශ කළ යුතු බවට නියම කරන ලදී. නාමයෝජනා දිනයේදී වත්කම් හා බැරකම් ප්‍රකාශ කරනු ලබන්නේ නම් එසේ කළ යුත්තේ මැතිවරණ කොමසාරිස්වරයාටය. ජනාධිපති වශයෙන් තේරී පත් වී ඇති බව ප්‍රකාශ කරන අවස්ථාවේදී මැතිවරණ කොමසාරිස්වරයාටත් ජනාධිපති ධූරයේ වැඩ භාරගත්නා අවස්ථාවේදී අග්‍ර විනිශ්චයකාරවරයාටත් තම වත්කම් බැරකම් ප්‍රකාශය බාර දිය හැකිය. ජනාධිපති වශයෙන් තනතුරේ වැඩ බාර ගැනීමට පෙරාතුව තම වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමට මේ අනුව ජනාධිපති බැඳී සිටියි. ජනාධිපතිවරයා මේ අතින් අනිත් අයට ආදර්ශයක් වන සේ කටයුතු කළ යුතුය.

## නීතිය අදාල වී තුන් මසක් ඇතුලත වත්කම් ප්‍රකාශ කිරීම

මෙම නීතිය අදාළ වන සෑම පුද්ගලයෙක්ම[4] තමාට මෙම නීතිය අදාළ වී තුන් මාසයක් ඇතුලත තමාගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ කළ යුතුය. එම ප්‍රකාශයට තමාගේ සියළු වත්කම් හා බැරකම්ද තමාගේ ස්වාමි පුරුෂයාගේ/ භාර්යාවගේ සියළු වත්කම් හා බැරකම්ද තමාගේ එක් එක් දරුවාගේ වත්කම් හා බැරකම්ද ඇතුළත් විය යුතුය.

1988 දී මෙම පනත කෙතරම් ප්‍රතිසංවිධානය කෙරුනාද යත් වෘත්තීය සමිති නිලධාරි මණ්ඩල සාමාජිකයන් මෙන්ම කතෘවරුන් ඇතුළු ජනමාධ්‍යවේදීන්ද තම වත්කම් බැරකම් ප්‍රකාශ භාර දිය යුතු බවට විධිවිධාන පනවන ලදී. මාධ්‍යවේදීන් අතරින් රාවය පුවත්පතේ කතුවරයා ඇතුළු එහි කතෘ මණ්ඩල සාමාජිකයන් අවස්ථා කිහිපයකදී තම වත්කම් බැරකම් ප්‍රකාශ භාරදීමට කටයුතු කර ඇත.[5] වෘත්තීය සමිති ආඥා පනත[6] මගින්ද වෘත්තීය සමිති නිලධාරී මණ්ඩල සාමාජිකයන් තම වත්කම් බැරකම් ප්‍රකාශයට පත් කළ යුතු බව නියම කර ඇති අතර සමාගම් පනත[7] මඟින් පුද්ගලික ආයතනවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තම වත්කම් බැරකම් ප්‍රකාශයට පත් කළ යුතු බවට නියමයන් පනවා තිබේ.

---

4. 3(1) සහ 3(2) වගන්ති වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ සංශෝධිත පනත
5. රාවය නියෝජ්‍ය කතෘ කේ ජනරංජන මහතා සමග කළ සාකච්ඡාව
6. 1981 අංක 20 දරණ වෘත්තීය සමිති ආඥා පනත්
7. 198 අංක 17 දරණ සමාගම් පනත්

## මැතිවරණ කොමසාරිස්වරයාගේ නියෝගය

මෙම වත්කම් බැරකම් නීතිය බලාත්මක කිරීම පිළිබඳව පුළුල් සංවාදයක් මෑතකදී පැනනැගුනේ මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය මහතා වසර 2011 මැයි මාසයේදී පැවති පළාත් පාලන මැතිවරණයෙන් පසුව තේරී පත් වූ සියළු සභිකයන් ඔක්තෝබර් 31 වනදාට පෙරතුව සිය වත්කම් බැරකම් ප්‍රකාශ අනිවාර්යයෙන් භාරදිය යුතු බව පැනවූ නියෝගයත් සමඟය. පනතට අනුව මැතිවරණ කොමසාරිස්වරයාට එවන් නියෝගයක් සිදුකළ නොහැකි බවට යම් තර්ක මතු වුවද අතළොස්සක් හැර සෙසු සියළු සභිකයින් තම වත්කම් බැරකම් ප්‍රකාශන භාරදීමට කටයුතු කරන ලදී. විවාදයක් බවට පරිවර්තනය නොවුවද මැතිවරණ කොමසාරිස්වරයාට එවන් නියෝග යක් කළ නොහැකි බවට තර්කයක් ගොඩනැගුනේ පනතට අනුව සභිකයින් තම වත්කම් බැරකම් ප්‍රකාශන භාරදිය යුතුව ඇත්තේ පලාතේ නාගරික කොමසාරිස්වරයාට[8] බැවිණි.

කැබිනට් ඇමතිවරුන් සහ නියෝජ්‍ය ඇමතිවරුන් ජනාධිපතිවරයාටද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කථානායකවරයාටද පළාත් සභා මැති ඇමතිවරුන් සහ පළාත් පාලන ආයතනවල නගරාධිපතිවරුන් හා සභාපතිවරුන් විෂය භාර කැබිනට් ඇමතිවරයාට ද තම ප්‍රකාශනයන් ඉදිරිපත් කළ යුතුය. මැතිවරණ කොමසාරිස්වරයා පැනවූ නියෝගයත් ඊට අදාළව ගොඩනැගුනු පුළුල් මාධ්‍ය ප්‍රචාරයත් යහපාලනය පිළිබඳව එහි අදාළත්වයත් අනුව යමින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය සම්භාෂණ කථිකාව ඔස්සේ මෙම මාතෘකාව මහජන සංවාදයකට ලක් කළේය.

වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය බලවත්ම නීතියක් වුවද එය දේශපාලන තලයේ පමණක් නොව දූෂණ විරෝධී ව්‍යාපාරවල පවා අඩුම සැළකිල්ලක් ලැබුනු නීතිය බවට මෙහිදී කරුණු අනාවරණය විය. මෙරට තොරතුරු දරනගැනීමේ අයිතිය බලවත් ආකාරයකින් ජනතාවට ලබාදී තිබෙන එකම නීතිය ලෙසද වත්කම් බැරකම් නීතිය හැඳින්විය හැකිය. එය වඩාත් බලාත්මක වනුයේ පුද්ගලයෙකු වත්කම් බැරකම් ප්‍රකාශයට පත් කිරීම මත පමණක් නොව මහජනතාව හෝ වෙනත් විවිධ කණ්ඩායම් විසින් එම වත්කම් බැරකම් ප්‍රකාශයන්ගේ පිටපත් ඉල්ලා පරීක්ෂා කළහොත්[9] පමණි.

## රාවය පුවත්පත කළ ඉල්ලීම

නීතිය අනුව යමින් රාවය පුවත්පත අවස්ථා කිහිපයකදී පාර්ලිමේන්තු මැති ඇමතිවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශන ජනාධිපති ලේකම්වරයාගෙන් සහ කථානායකවරයාගෙන් ඉල්ලා සිටියහ.[10] එහෙත් විවිධ හේතු දක්වමින් ප්‍රකාශන

---

8. දෙවන වගන්තිය වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ සංශෝධිත පනත 1988
9. www.tisrilanka.org/?p=8528
10. රාවය පුවත්පත 2004-08-29

පිටපත් ලබා දීම ප්‍රතික්ෂේප කෙරුණි. ඉල්ලීමට ප්‍රතිචාර ලෙස ඔවුන් සඳහන් කළ ප්‍රධානම කරුණ වූයේ වත්කම් බැරකම් ප්‍රකාශන ලබාදීම සඳහා අයකෙරෙන ගාස්තු නියමකර නොමැති බැවින් ඒ පිළිබඳව උපදෙස් ලබාගත යුතු බවය. අවසානයේදී රුපියල් 5000 ක චෙක් පතක් පාර්ලිමේන්තු මහ ලේකම්වරයාට ඉදිරිපත් කළ රාවය කතෘ වික්ටර් අයිවන් මහතා අදාළ මුදල් අයකරගෙන වත්කම් බැරකම් ප්‍රකාශන පිටපත් ලබාදෙන ලෙස ඉල්ලා සිටියේය. ඒ අනුව මුදලක් අය කරමින් පාර්ලිමේන්තු මහ ලේකම්වරයා රාවය පුවත්පත ඉල්ලා සිටි ප්‍රකාශන ලබාදීමට කටයුතු කරන ලදී. 2004 ජනාධිපතිවරණය අවස්ථාවේදී ද ජනාධිපතිවරණයට තරග වැදුණු ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනා වන චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ සහ රනිල් වික්‍රමසිංහ මහතාගේ වත්කම් බැරකම් ප්‍රකාශ මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ලබාගෙන මහජනතාවගේ දැනගැනීම සඳහා ඒවා ප්‍රසිද්ධ කිරීමට රාවය පුවත්පත සමත් විය.

තම වත්කම් බැරකම් ප්‍රකාශන කථානායකවරයාට භාරදිය යුතු බවට පවතින නියමයන්ට අනුව ක්‍රියාකර ඇත්තේ මන්ත්‍රීවරුන් ඉතා සුළුතරයක් පමණක්යැයි මතයක් සමාජය තුළ පවතී. කෙසේ වුවද 2010 මාර්තු මාසය[11] වන විට මන්ත්‍රීවරුන් 09 දෙනෙකු හැර සෙසු මන්ත්‍රීවරුන් සියළුදෙනාම කථානායකවරයාට තම ප්‍රකාශ බාරදී තිබුණි. 2009 වසරේ පළාත්සභා මැතිවරණයේදී බස්නාහිර පළාත් සභාවට පොදු ජන එක්සත් පෙරමුනෙන් තරග වැදුණු උදය ගම්මන්පිල මහතාද, එක්සත් ජාතික පක්ෂයෙන් තරග වැදුණු ශිරාල් ලක්තිලක මහතාද, නාමයෝජනා බාරදුන් අවස්ථාවේදීම තම වත්කම් බැරකම් ප්‍රකාශන ඉදිරිපත් කරමින් මාධ්‍යය හරහා එය ප්‍රසිද්ධියට පත් කිරීමට ක්‍රියාකිරීමද කැපී පෙණුනි.

පාර්ලිමේන්තුවේ ඇතැම් මන්ත්‍රීවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශන ලබාගැනීමට ඕනෑම පුද්ගලයෙකුට ලිඛිතවම ඉල්ලා සිටිය හැකි බව පනතේ[12] සඳහන් වේ. එසේ වුවද එම ඉල්ලීම අනුව ප්‍රකාශනවල පිටපත් ලබාදිය යුතු බවට අනිවාර්ය කිරීමක් හා ඒ සඳහා ගෙවිය යුතු ගාස්තු පිළිබඳව එහි සඳහන් නොවේ.

එමෙන්ම ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පුද්ගලයා හෝ කණ්ඩායම හෝ සංවිධානය හෝ සපුරාලිය යුතු බවට සඳහන් සුදුසුකම්ද වත්කම් බැරකම් ප්‍රකාශන ලබාගැනීමට පවත්නා තවත් ප්‍රධාන බාධකයකි.

වත්කම් බැරකම් ප්‍රකාශන ලිඛිතව ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට හෝ ඉන් මග ඇර සිටීමට අදාළ බලධාරීන්ට හිමිව ඇති තවත් වරප්‍රසාදයක් වනුයේ මෙයට පෙරදී වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදීම ප්‍රතික්ෂේප කරන්නේනම් උසාවි ගොස් එම බලධාරීන්ට එරෙහිව පැමිණිලි කිරීමට මහජනතාවට පැවති හැකියාව 1988 සංශෝධනයෙන් අහෝසි කිරීමය.[13] මෙම පනතට සිදුකළ සංශෝධනයක් හරහා එකී බලය අල්ලස් හෝ

11. හැන්සාඩ් වාර්තා 2010 මාර්තු
12. 1988 වත්කම් බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ සංශෝධන පනත 5(3) වගන්තිය
13. පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂක රෝහණ හෙට්ටිආරච්චි මහතා සමග කළ සාකච්ඡාව

දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව යටතට පත් කර ඇත. එම බලය යොදා ගනිමින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව දැනට විමර්ශන කටයුතු සිදුකරනුයේ වත්කම් බැරකම් සම්බන්ධයෙන් ලැබෙන පැමිණිල්ලකදී පමණි.

## දණ්ඩනයෙන් ප්‍රමාණවත් නොවීම

වත්කම් බැරකම් ප්‍රකාශනයක් බාරදුන් පමණින් දේශපාලඥයින් අනිසි ලෙස මුදල් ඉපයීම නැවැත්විය හැකිද යන්න අවධානය යොමුකළ යුතුය. නීතියක් ප්‍රබලවීමට එහි පවත්නා දණ්ඩනයන්ද බලපායි. දණ්ඩනය ප්‍රමාණවත් නොවන විට නීතිය සමාජය තුළ නිසියාකාරව ක්‍රියාත්මක වන්නේ නැත.

පනත යටතේ වැරදි වශයෙන් සැළකෙන කරුණු සහ ඒවාට නියමිත දඩුවම්[14] දක්වා ඇත. සාධාරණ හේතුවක් නොමැතිව නීතිය යටතේ කළ යුතු වත්කම් හා බැරකම් ප්‍රකාශයක් නොකිරීම, එකී යම් ප්‍රකාශයක අසත්‍ය ප්‍රකාශ කිරීම, එවැනි ප්‍රකාශයක කිසියම් වත්කමක් හෝ බැරකමක් සිතාමතාම ප්‍රකාශ නොකර සිටීම, අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසම විසින් නියම කරන අතිරේක තොරතුරු සැපයීම සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හැරීම, මෙම පනතේ වෙනත් කිසියම් විධි විධානයක් කඩකිරීම පනත යටතේ වරදකි.

මෙම සියළු වැරදි සම්බන්ධයෙන් නියම කර ඇති දඩුවම වනුයේ රු 1000 කට නොවැඩි දඩයක් හෝ වසරකට නොවැඩි සිර දඩුවමක් හෝ ඒ දෙකමය.[15] එහෙත් වත්කම් ප්‍රකාශයක කිසියම් වත්කමක් හෝ බැරකමක් උවමනාවෙන්ම ප්‍රකාශ කිරීම පැහැර හැරීම සම්බිධයෙන් පුද්ගලයෙකු වරදකරු කිරීමේදී එම වරදට අදාළ වත්කම් සියළු බැඳීම් වලින් තොරව රජයට පැවරීමට යටත් වේ. එමෙන්ම නීතිපතිතුමාගේ පූර්ව අනුමැතියකින් තොරව මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් කිසිම නඩුවක් පැවරිය නොහැක.

වත්කම් බැරකම් නීතිය පළමුව හඳුන්වා දුන් වසර 1975 සිට මේ දක්වා ගතවූ වසර 36 තුළ වත්කම් බැරකම් ප්‍රකාශ බාර නොදීමේ වරදින් සිරගත කෙරුණු පුද්ගලයෙකු පිළිබඳව තොරතුරු වාර්තා වන්නේ නැත.

ප්‍රායෝගිකව රට තුළ පවත්නා ස්වභාවයද දේශපාලකයන් හා නිලධාරීන් තම වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටීමටද හේතුවක් වී ඇත. වසර 2011 දෙසැම්බර් මාසයේදී නිකුත් කෙරුණු ලෝක දූෂණ මාපකයේ දකුණු ආසියානු වාර්තාවට[16] අනුව ශ්‍රී ලාංකිකයන්ගෙන් සියයට 49 ක් පොලීසියත් දේශපාලන පක්ෂත් දූෂිත බව සඳහන් කර තිබුණි. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය

14. 1988 වත්කම් බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ සංශෝධන පනත 9(1) (ඇ) වගන්තිය
15. 9(5) වගන්තිය
16. දෛනික ජීවිත සහ දූෂණය දකුණු ආසියාවේ මහජන මතයී ගෝලීය දූෂණ මාපකය 2011 දකුණු ආසියානු වාර්තාව

නිකුත් කළ 2011 ජාතික සුපිළිපන් වාර්තාව (NIS)[17] මගින්ද පාලනයේ කුළුණු ලෙස හැඳින්වෙන නීතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතනවල පවත්නා දුර්වලතාවයන් අනාවරණය කර තිබුණි. මෙවන් වාතාවරණයක් මධ්‍යයේ නීතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවන පරිසරයක් තුළ පුද්ගලයන් තමන් සතුව ඇති වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමට ඉදිරිපත් නොවෙති. එයට හේතුව එම තොරතුරු ප්‍රසිද්ධියට පත් වීම හරහා තමන්ට අත්විඳීමට සිදුවිය හැකි ව්‍යාකූල තත්ත්වයන් පිළිබඳව අවිශ්වාසයක් ඔවුන් තුළ පැවතීමය.

වත්කම් බැරකම් පිළිබඳ පනතේ තුන්වන වගන්තියේ සඳහන්වන පරිදි ජනාධිපතිවරණයට හා පාර්ලිමේන්තු මැතිවරණයට තරග වදින අපේක්ෂකයන් නාමයෝජනා බාරදෙන අවස්ථාවේදී හෝ තේරීපත්වුවහොත් ධූරයේ වැඩ බාරගැනීමට පාර්ලිමේන්තු අසුන බාරගැනීමට හෝ ඡන්දය පාවිච්චි කිරීමට පෙරාතුව තම වත්කම් බැරකම් ප්‍රකාශන බාරදිය යුතුව ඇත. නමුත් 1988න් පසු පැවති සෑම පාර්ලිමේන්තු වාරයකදීම තේරී පත් වූ මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙක් දිවුරුම් දී කළක් ගතවන තෙක්ම[18] වත්කම් බැරකම් ප්‍රකාශන බාර දී නොතිබුණි. එය බරපතල නීති උල්ලංඝණය කිරීමකි.

## වත්කම් ප්‍රකාශනයක නිරවද්‍යතාවය සොයා බැලීම

පනතේ ප්‍රධානතම දුර්වලතාවයක් වනුයේ කිසියම් පුද්ගලයෙකු ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශනයක නිරවද්‍යතාවය සොයා බැලීමේ යාන්ත්‍රණයක් නොමැතිවීමය. පනත මුලින්ම හඳුන්වා දුන් 1975 සිට මේ දක්වා විවිධ දේශපාලකයන් හා නිලධාරීන් ඉදිරිපත් කළ ප්‍රකාශනයන්හි නිරවද්‍යතාවය සොයාබැලීමේ විමර්ශනයක් සිදුකළ බවක් දැනගන්නට නොමැත.

1988 ට පෙරාතුව මුල් ප්‍රකාශනය කිරීමෙන් පසු සෑම අවුරුදු 5 කටම වරක්ම වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම කළ යුතු විය. 1988 අංක 74 දරන පනත මගින් මෙම තත්ත්වය වෙනස් කොට ඇත. ඒ අනුව දැන් සෑම රාජ්‍ය නිලධාරියෙක්ම ඒ ඒ වසරේ මාර්තු 31 වනදා විට තමා සතු සියළු වත්කම් හා බැරකම් අදාළ වසරේ ජුනි 30 වන දිනට පෙර ප්‍රකාශ[19] කළ යුතුය. එම ප්‍රකාශනයෙහි ඔහු මුලින්ම වත්කම් ප්‍රකාශ කළ යුතු දිනයේදී ඔහු සතුව තිබූ වත්කම් හා බැරකම්ද සඳහන් කළ යුතුය.

වත්කම් ප්‍රකාශ කරන නිලධාරියා ඔහුගේ වත්කම් ප්‍රකාශනයේ සඳහන් වත්කම්වල වටිනාකම ප්‍රකාශ කිරීම අවශ්‍ය නොවේ.[20] ඔහු වත්කම්වල වටිනාකම දැක්විය යුත්තේ එම වත්කම මුදල්වලින් සමන්විත වේ නම් පමණකි.

17. http://www.tisrilanka.org/pub/reports/NIS_SL_2010.pdf
18. සන්ඩේ ලීඩර් පුවත්පත 2003 ජුලි 27
19. 3(3) වගන්තිය වත්කම් බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ සංශෝධන පනත 1988
20. 10 (ඇ) වගන්තිය

රාජ්‍ය නිලධාරීන් හෝ රාජ්‍ය සංස්ථා සේවකයින් හෝ පළාත් පාලන සේවකයින් පත් කිරීමේ හා උසස් කිරීමේ වගකීම පැවරි ඇති රාජ්‍ය බලධාරීන්ට[21] එම නිලධාරීන්ගේ වත්කම් ප්‍රකාශන කැඳවා බැලීමේ අයිතිය ඇත. නීතිපතිතුමාට අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්තුමාට සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට[22] කිසියම් පුද්ගලයෙකු විසින් කර ඇති වත්කම් හා බැරකම් ප්‍රකාශන ගෙන්වා බැලීමේ අයිතිය ඇත.

මේ ඉහත කී නිලධාරීන්ට වත්කම් බැරකම් ප්‍රකාශන ගෙන්වා බැලීමේ අයිතිය ඇති නමුදු ඔවුන් මෙම අයිතිය පාවිච්චි කරන්නේ එවැනි ප්‍රකාශනයක් ගෙන්වා බැලීමේ අවශ්‍යතාවයක් මතු වූ විටදී පමණි. එවැනි අවශ්‍යතාවයක් මතු වන්නේ වත්කම් හා බැරකම් ප්‍රකාශ කර ඇති පුද්ගලයෙකුට එරෙහිව ලැබී ඇති පැමිණිල්ලක් හෝ නිවේදනයක් අනුව ඔවුන් විසින් ඒ පිළිබඳව විමර්ශනය කිරීමේ අවශ්‍යතාවය මතු වී ඇති අවස්ථාවකදී පමණි. එසේ නොවේනම් මේ කිසිම බලධාරියෙක් වත්කම් හා බැරකම් ප්‍රකාශන ගෙන්වා ගෙන බැලීමට කටයුතු නොකරති.

1988 අංක 74 පනත මගින් අලුතින් අල්ලස් පනතට ඇතුලත් කරන ලද 9(අ) වගන්තිය මගින් වත්කම් හා බැරකම් ප්‍රකාශවල අසත්‍ය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් හෝ කිසියම් වත්කමක් ප්‍රකාශ කිරීම උවමනාවෙන් පැහැර හැරීම සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් උසාවිය වෙත පුද්ගලිකව පැමිණිල්ලක් කිරීමේ බලය මහජනතාව වෙත ලබා දී ඇත. එස් නඩු පැවරීම සඳහා නීතිපතිතුමාගේ පූර්ව අනුමැතිය අවශ්‍ය නොවේ.

## පැමිණිලිකරුවකු ජයගත යුතු බාධක

කෙසේ නමුත් අධිකරණය වෙත පෞද්ගලිකව පැමිණිල්ලක් කිරීමට පෙර පැමිණිලිකරුවෙකු විසින් ජයගත යුතු බාධක කිහිපයක් ඇත.

(අ) පැමිණිල්ල සමග කරන ලදැයි කියන වරදට අදාළ වත්කම් ප්‍රකාශයේ සහතික පිටපතක් ඉදිරිපත් කළ යුතුය. ඒ නිසා පුද්ගලිකව පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට පෙර පනතේ 5(3) වගන්තිය යටතේ අදාළ බලධාරියාගෙන් සහතික පිටපතක් ලබා ගැනීමට පැමිණිලිකරුට සිදු වේ.

(ආ) විත්තිකරුට නඩු ගාස්තු ගෙවීමත් අධිකරණය මගින් නියම කරනු ලබන වන්දියක් ගෙවීමත් සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන මුදලක් පැමිණිලිකරු විසින් අධිකරණයේ තැන්පත් කළ යුතුය. එසේ එම මුදල තැන්පත් කර නොමැති නම් එකී පුද්ගලයාට විරුද්ධව කටයුතු කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු ඇතැයි යන්න මහේස්ත්‍රාත්වරයාගේ මතය වුවද අධිකරණය විසින් ඔහුට විරුද්ධව සිතාසි නිකුත් නොකරනු ඇත.

21. සම්භාෂණ සංවාදය 2011 ඔක්තෝබර 31ග රාවය කර්තෘ වික්ටර් අයිවන් මහතා
22. 5(2) වගන්තියි

(ඇ)මහේස්ත්‍රාත්වරයා විසින් චූදිත නිදහස් කොට හෝ මුදා හැර කර ඇති පැමිණිල්ල පදනම් විරහිත හෝ නිරර්ථක එකක් යැයි නියම කළ විට පැමිණිලිකරු රජයේ ගාස්තු නඩු ගාස්තු සහ චූදිතට වන්දි ගෙවීමට යටත් වන්නේය.

දේශපාලකයන් සහ ආණ්ඩුවේ ඉහළ නිලධාරීන් විසින් අල්ලස් හා දූෂණය මගින් නීති විරෝධී ලෙස තම වත්කම් වැඩිකර ගැනීමට එරෙහිව ක්‍රියාකිරීමේ මහත් බලාපොරොත්තු ඇතුව වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත පනවන ලද නමුත් පනතේම අඩංගු බරපතල අඩුපාඩු හා දුර්වලතා හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කර ගැනීමට නොහැකි වී ඇති බව පැහැදිලිය.[23] අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව වැනි ආයතනයන් පවා වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ වැඩි ප්‍රතිඵලයක් ලබා නොමැති බව පෙනී යයි. ඉකුත් වසර කිහිපය තුළදී මෙම පනත යටතේ පවරා ඇත්තේ නඩු ඉතා සුළු ගණනකි. ඉන් සාර්ථක වී ඇති නඩු සංඛ්‍යාවද අල්පය. ප්‍රධාන පෙළේ දේශපාලනඥයින් දෙදෙනෙකුට විරුද්ධව පවරන ලද නඩු දෙකට අදාළ කරුණු විමර්ශන ඇරඹුණේ අහඹු ලෙසය. අමාත්‍ය එස්. බී. දිසානායක මහතාට එරෙහිව අල්ලස් කොමිසම පනවන ලද නඩුවෙන් ඔහු නිදොස් කර නිදහස් කරන ලදී. හිටපු ඇමති අනුරුද්ධ රත්වත්තේ මහතාට විරුද්ධව නඩු පැවරීම සිදුවූයේ ඔහුගේ බැංකු ආරක්ෂක පෙට්ටිවල තිබී රුපියල් කෝටි 4 ක තැන්පත් සහතික හමුවීම නිසාය.

## දේශපාලකයින් පනත අනුව කටයුතු නොකිරීම

වත්කම් ප්‍රකාශයක් කිරීමට අසමත් වීම නීතිය අනුව වරදකි. නියමිත කාල පරිච්ඡේදය තුළ වත්කම් ප්‍රකාශයක් කිරීමට නොහැකි වීමද වරදකි. එහෙත් දේශපාලඥයින්ගෙන් විශාල සංඛ්‍යාවක් මෙම නීතිය අනුව කටයුතු නොකරති. බොහෝ මැති ඇමතිවරුන් හා ඡන්ද අපේක්ෂකයින් මෙන්ම රාජ්‍ය නිලධාරින්ද නීතිය කඩකොට ඇති අතර ඔවුන්ට විරුද්ධව නඩු පැවරිය යුතුව තිබුනි. එහෙත් නීතිය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් හෝ එවැනි බලධාරියෙකු හෝ බලය පැවරී ඇති ආයතනයක් නොමැත. මෙම නීතිය කඩකරන පුද්ගලයන්ට එරෙහිව නඩු පැවරීමේ වගකීම හෝ බලය පැවරී ඇති ආයතනයක් හෝ පුද්ගලයෙක් ගැන පනතේ සඳහන් නොවේ. බලධාරීන් සිටින්නේ වත්කම් ප්‍රකාශයන් එක් රැස් කර තබා ගැනීමටය. නීතිය ක්‍රියාත්මක කරවීම ගැන හෝ ප්‍රකාශයක අඩංගු කරුණු සත්‍යද අසත්‍යද යන්න ගැන ඔවුහු සැළකිල්ලක් නොදක්වති.

නීතිපතිවරයා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වැනි අනිත් බලධරයන්ට හැක්කේ වත්කම් හා බැරකම් ප්‍රකාශනයක් ඇත්නම් ඒවා ගෙන්වා බැලීම පමණකි. වත්කම් ප්‍රකාශ කරන ලෙස බල කිරීමට ඔවුන්ට නොහැකිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් කිසිදු අවහිරයකින් තොරව මෙම නීතිය කඩ කිරීමටත් එය නිරර්ථක දෙයක් බවට පත් කිරීමටත් හැකි වී ඇත.

23. සම්භාෂණ සංවාදය 2011 ඔක්තෝබර 31. පළාත් සභා අමාත්‍ය උදය ගම්මන්පිල මහතා

වත්කම් පනතට යටත් වන පුද්ගලයකු මෑතකදී ඔහුගේ වත්කම් හා ආදායම් මාර්ග ඉක්මවා යන වත්කම් හෝ දේපළ අත්පත් කර ගෙන ඇතැයි හෝ වියදමක් දරා ඇතැයි කියමින් වත්කම් ප්‍රකාශයක අඩංගු කරුණු ගැන හෝ ලිඛිත නිවේදනයක් පිළිබඳ විමර්ශනයකට අදාළ කරුණු ගැන හෝ කවර හෝ පුද්ගලයෙකු විසින් ප්‍රසිද්ධ ප්‍රකාශයක් කිරීම පනත යටතේ වරදකි.[24] මෙම තත්ත්වය හේතු කොට ගෙන කිසියම් පුද්ගලයෙකු ඉදිරියට පැමිණ ලිඛිත පැමිණිල්ලක් කරාවි යැයි කෙනෙකුට බලාපොරොත්තු විය නොහැකිය.

'ප්‍රසිද්ධ ප්‍රකාශයක්' යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි මෙහි සඳහන්ව නොමැත. ඒ පිළිබඳ නිර්වචනයක්ද නැත.

අල්ලස් හෝ දූෂණය මර්දනය කිරීමේ චේතනාවෙන් බලධරයෙකු වෙත පැමිණිල්ලක් කරන පුද්ගලයෙකුට එරෙහිව ප්‍රසිද්ධ ප්‍රකාශයක් කිරීම ගැනත් වත්කම් හා බැරකම් ප්‍රකාශයක අසත්‍ය ප්‍රකාශයක් කිරීම හෝ ඕනෑකමින් හෝ හිතාමතාම වත්කමක් ගැන වසන් කිරීම ගැනත් එකම දඩුවම පනවා තිබීම ගැටළුකාරිය.

පනතේ 7 වන වගන්තිය අනුව නීතිපතිවරයා අල්ලස් හා දූෂණ කොමිසම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ ප්‍රධාන රේගු අයකැමි යන බලධරයෙක් වත්කම් ප්‍රකාශයක් කර ඇති පුද්ගලයෙකු විසින් ඔහුගේ පෙනෙන ආදායමට හෝ ධනයට වඩා වැඩි වත්කම් උපයා ගෙන ඇති බවට හෝ ඒවා ඉක්මවා වියදම් දරා ඇති බවට වෙනත් අයෙකුගේ ලිඛිත පැමිණිල්ලක් ලැබෙන තුරු ඒ පිළිබඳව විමර්ශනය කිරීමක් සිදු නොකරයි. එසේ විමර්ශනය කරන්නේ එවැනි ලිඛිත පැමිණිල්ලක් හෝ නිවේදනයක් ලැබුණු පසු පමණකි.

වත්කම් ප්‍රකාශයක් ලබා ගන්නා බලධරයන් හෝ ඉහත නම් කොට ඇති බලධරයන් එවැනි ලිඛිත පැමිණිල්ලක් නොමැතිව කිසිදු විමර්ශනයක්[25] සිදු නොකරති. අදාළ බලධාරීන්ටම ඒ පිළිබඳව පරීක්ෂා කිරීමේ හැකියාව තිබියදී බලධාරීන්ගේ අවධානය යොමු කරමින් බලධාරීන් වෙත ලිඛිත පැමිණිල්ලක් කිරීමට කෙනෙකු කරදර විය යුත්තේ මන්ද ? පෞද්ගලික හෝ දේශපාලන හේතුවක් නොමැතිව කිසිදු පුද්ගලයෙක් ඉහළ තනතුරක සිටින පුද්ගලයෙකුට විරුද්ධව තමාගේ නමින් තම අත්සන යොදා ලිඛිත පැමිණිල්ලක් කිරීමේ අවධානමට මුහුණ දේයැයි කෙනෙකුට බලාපොරොත්තු විය නොහැකිය. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම් සභාවට මහජනතාවගෙ න් වත්කම් පිළිබඳව පැමිණිලි මේ සා අඩුවෙන් ලැබීමට එම හේතුවද බලපා ඇත.

24. 7(4) වගන්තිය
25. 9(5) වගන්තිය

## නිගමන හා නිර්දේශ

වත්කම් බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ පනත තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කෙරෙන මෙන්ම අල්ලස, දූෂණය වැළැක්වීම සඳහා පවත්නාවූ ප්‍රයෝජනවත් අවියකි. 1988 දී මෙම පනත යළි සංශෝධනය කළද එය තත්කාලීනව හා වඩාත් ප්‍රබලව පනතක් ලෙස සවිබලගැන්වීම අවශ්‍යයෙන්ම සිදුවිය යුතු බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ස්ථාවරයයි.

- වත්කම් ප්‍රකාශයන් නීතියේ ප්‍රකාරව ඉදිරිපත් නොකිරීමත් හිතාමතාම යම් වත්කම් ගැන හෙළිදරව් නොකිරීමත් ඉතා බරපතළය. එබැවින් පවත්නා නීති රෙගුලාසීන් ශක්තිමත් කරලීම සඳහා පහත නිර්දේශ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් ඉදිරිපත් කරනු ලබයි.

- ඕනෑම මැතිවරණයකට තරග කරන අපේක්ෂකයන් නාමයෝජනා ලබාදෙන අවස්ථාවේදීම මෙම වත්කම් බැරකම් ඉදිරිපත් කිරීම අනිවාර්යය කිරීම.

- එලෙස කටයුතු නොකරන අපේක්ෂකයින් තේරී පත්වුවහොත් එම අපේක්ෂකයාගේ මන්ත්‍රී ධූරය අහෝසි කළ හැකිවන පරිදි නීති පැනවීම.

- එමෙන්ම පනත අදාළ වන නිලධාරීන්ද මාස තුනක් ඇතුළතදී තම වත්කම් සහ බැරකම් ප්‍රකාශ නොකළහොත් එම නිලධාරියාට එරෙහිව දඩුවම් පැමිණවීමට හැකිවන පරිදි සංශෝධනයක් ඉදිරිපත් කිරීම.

- පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් තේරී පත්වී මාස 3 ක් ඇතුළත තම වත්කම් බැරකම් ප්‍රකාශන බාර නොදෙන්නේ නම් අදාළ මන්ත්‍රිධූරය අහෝසි කිරීමට හැකිවන නීති පැනවීම.

- වත්කම් ප්‍රකාශන ලිඛිතව ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට හෝ ඉන් මගහැර සිටීමට කටයුතු කරන නිලධාරීන්ට එරෙහිව නීති මගින් කටයුතු කිරීමට හිමිකම ජනතාව වෙත ලබාදීම.

- එමෙන්ම ව්‍යාජ වත්කම් බැරකම් ප්‍රකාශන ඉදිරිපත් කරන පුද්ගලයන්ට එරෙහිව දැනට පවත්නා දණ්ඩනයන් දැඩි කිරීම.

Position Paper

# TISL urges public to advocate for action on 2011 COPE Report

Transparency International Sri Lanka
6, 37th Lane, Queen's Road, Colombo 3

Phone: 011 4369781 - 3
Fax: 011 2506419
Email: tisl@tisrilanka.org
www.tisrilanka.org